දෙපාර්තමේන්තු චක්‍ර ලේඛ අංක : 19 /2012

මගේ අංකය - කේ.08/ක්‍ෂයරෝග/11
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09,
2012.03.20 වෙනි දින.

සියලුම බන්ධනාගාර අධිකාරීන්,
සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත.

## බන්ධනාගාර ආයතනවල ක්‍ෂයරෝග ව්‍යාප්ත වීම

දිවයිනේ සෑම අවුරුද්දකම සැලකිය යුතු ක්‍ෂයරෝගීන් සංඛ්‍යාවක් වාර්තා වන බව ක්‍ෂයරෝග මර්ධන හා ශ්වසන රෝග පිළිබඳ ජාතික වැඩසටහන විසින් පෙන්වා දෙයි. එමෙන්ම බන්ධනාගාර ගතවූ පුද්ගලයින්ගෙන් සැලකිය යුතු ප්‍රතිශතයකට මෙම රෝග කාරකය ආසාදනය වී ඇති බව ඉහත වැඩසටහන් ඒකකය විසින් මා වෙත වාර්තා කර ඇත.

ඒ අනුව, මෙම කරුණ සම්බන්ධයෙන් ඔබ ආයතනයේ නේවාසික /නේවාසිකාවන් දැනුවත් කර එම රෝගය පැතිරයාම වැලැක්වීම සඳහා පහත සඳහන් පියවර ගැනීමට කටයුතු කරන ලෙස දන්වා සිටිමි.

01. බන්ධනාගාර ගත කරන සෑම රැඳවියෙකුම වෛද්‍යවරයාට යොමු කරවීමෙන් අනතුරුව එම පුද්ගලයින්ගෙන් යම්කිසි අයෙකු හට ක්‍ෂයරෝගය වැළදී ඇති බවට තීරණය කලහොත් එම අවස්ථාවේම ඔහු/ඇය වෙත නිකුත් කරන ටී.බී -01 ප්‍රතිකාර සටහන් පත්‍රිකාවේ පිටපත් 02 ක් ආයතන අධිකාරී වරයා විසින් සහතික කර ඉන් එකක් අදාල රැඳවියාගේ රිමාන්ඩ් බලපත්‍රය / දඬුවම් බලපත්‍රය සමග ඇමිණිය යුතු අතර, අනික් පත්‍රිකාව ආයතනයේ බන්ධනාගාර රෝහලට හෝ බෙහෙත් ශාලාවට ලබාදිය යුතුය. මෙම රෝගකාරකය ආසාදනය වූ රැඳවියෙකුට මාස හයක කාලයක් අඛණ්ඩව ප්‍රතිකාර ලබාදිය යුතු බැවින්, යම්කිසි අවස්ථාවක අදාල රැඳවියා වෙනත් ආයතනයකට මාරු කර යැවීමට සිදුවන්නේ නම් ඉහතකී ටී.බී. -01 ප්‍රතිකාර සටහන් පත්‍රිකා පිටපත් 02 ක් නේවාසිකයාගේ රිමාන්ඩ් බලපත්‍රයට හෝ ගොනුවට අමුණා යැවීමට කටයුතු කල යුතුය.

02. මීට අමතරව, මෙම රෝගය අසාදිත පුද්ගලයෙකු නියමිත ප්‍රතිකාර කාල සීමාව අවසන් වීමට ප්‍රථම බන්ධනාගාරයෙන් නිදහස් වන අවස්ථාවල ඔහුට අයත් ටී.බී -01 පෝරම දෙකෙන් එක් පෝරමයක් ඔහු වෙත ලබාදී ලගම ඇති ලය චිකිත්සාගාරයට ගොස් අවශ්‍ය වැඩිදුර ප්‍රතිකාර ලබා ගන්නා ලෙස දැනුවත් කර යැවීමට පියවර ගත යුතුය.

03. මේ සම්බන්ධයෙන් පසුගියදා පැවති වැඩමුළුවට සහභාගිවූ ඔබ ආයතනයේ ලියාපදිංචි ලිපිකරු අංශයේ විෂයට අදාල ජේලර් වරයා හා /හෝ විෂය භාර නිලධාරියා ඉහත උපදෙස් අනුව කටයුතු කරන ලෙසට ඔවුන් දැනුවත් කර එම කටයුතු සාර්ථකව සිදු කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසට ඔබට මෙයින් දන්වමි.

පී.ඩබ්ලිව් කොඩිප්පිලි
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්